රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:32/89(II)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1989 සැප්තැම්බර් මස 21 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

1980 ජූලි මස සිය තනතුරු අතහැර ගිය රාජ්‍ය අංශයේ සේවකයන් සම්බන්ධයෙන් නිරාකරණය නොවී පවත්නා කරුණු කඩිනමින් විසඳීම.

අංක. 32/89(I) හා 89.06.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතරවය.

02. 1980 ජූලි මස තනතුරු අත්හැර ගිය සේවයේ පිහිටුවා නොමැති රාජ්‍ය සේවාවේ කම්කරු ශ්‍රේණි වලට අයත් වුවත් සම්බන්ධයෙන් පහත දැක්වෙන පරිදි ක්‍රියා කළ යුතුය.

03. 1989.05.08 දිනට හෝ එදිනට පෙර සිය ස්ථිර තනතුරෙහි දස වසරක් සම්පූර්ණ කරන නිලධාරියකුට, ආයතන සංග්‍රහයේ IV වෙනි පරිච්ඡේදයේ 6:4 වගන්තියෙහි විධිවිධාන අනුව විශ්‍රාම වැටුප් හිමි තත්වය ලබාදිය යුතුය. ඉන් අනතුරුව, අංක. 32/89(I) හා 1989.06.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව ඔහුගේ විශ්‍රාම ගැන්වීමේ කටයුතු කළ හැකිය.

04. ඉහත සඳහන් ගණයට අයත් යම් නිලධාරයෙකු 1989.05.08 දිනට පෙර වයස අවුරුදු 55 ට, එනම් විශ්‍රාම ගැන්වීමේ වෛකල්පික වයස් සීමාවට එළඹෙන නමුදු, එදින වන විට ඔහුට දස වසරක සේවා කාලයක් නොමැති නම්, ඔහු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 5:3:1 වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කරමින්, විශ්‍රාම වැටුපක් ලබාදීමේ හැකියාව ගැන පරීක්ෂා කර බැලිය යුතුය. එහෙත්, එම සේවා දීර්ඝ කිරීම 1989.05.08 දින කොළඹමවිය යුතුය.

05. ඉහත කී විධිවිධාන අදාල වනුයේ 1962 අංක V දරණ සැසි වාර්තාවේ සඳහන් තනතුරු සඳහා පමණි.

(පී. එන්. එම්. ප්‍රනාන්දු)
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

ඒ/22.